**වී අලෙවි මණ්ඩලය - 2020**

**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 වියාචනය කළ මතය

වී අලෙවි මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මූල්‍ය වාර්තා ප්‍රමාද වීම හේතුවෙන් මණ්ඩලය සම්බන්ධ ගනුදෙනු පිළිබඳ වාර්තාව 2022 නොවැම්බර් 22 දින භාෂාත්‍රයෙන් යුතුව පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත. තවද පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය වියාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ වියාචනය කල මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මා ගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය අනුව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු තරමින් සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කලයුතු අතර අපේක්ෂා තත්ත්වයන් ඉහත දී කළ ඇස්තමේන්තු වලින් වෙනස් වන්නේ නම් එම වෙනස්කම් ශ්‍රී.ලං.ගි.ප්‍ර. 8 ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් ලෙස ගිණුම් ගත කළයුතු වූවත් 2020 දෙසැම්බර් 31 දිනට ලියාහල අගය රු.951,765,591 ක් වූ මණ්ඩලයේ ස්ථාවර වත්කම්වල අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කර නොතිබුණි. | 2020 වර්ෂය අවසන් වන විට වී අලෙවි මණ්ඩලය සතු ඇතැම් වත්කම් ක්ෂය වී අවසන්ව ඇත. එය මේ වන විටත් භාවිතයට ගන්නා අතර නැවත අගය කිරීමට සිදු වී නොමැත. ඒ අනුව ඉදිරියේදී එම ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන බව. | ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයේ සමාලෝචිත වර්ෂයේ රජයේ මූලධන ප්‍රදාන වලින් මිලදී ගත් වත්කම් සඳහා ක්ෂය රු.72,239,655 ක්ව පැවතියදී එය ඉක්මවා රු.149,431,804 ක් විලම්භිත ආදායම ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු.77,192,149 ක් වැඩියෙන් හා ජංගම නොවන වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේ දී නිවැරදි කරනු ලැබේ. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ආ) | ඉකුත් වර්ෂයේ අවසන් තොග වටිනාකම රු.99,391,958 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ ආරම්භක තොග වටිනාකම ලෙස රු.274,658,564 ක් ගෙන 2020 දෙසැම්බර් 31 දිනට ඉතිරි තොග වටිනාකම රු.577,498,157 ක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හේතුවෙන් තොගය රු. 174,666,606 ක් වැඩිපුර දක්වා තිබුණි. | 2021 ගිණුම් සකස් කිරීම තුළින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | විකුණුම් පිරිවැය ගණනය කිරීමට අදාලව ඇතුලත් කළ යුතු ඍජු පිරිවැය රු.35,029,837 ක් පරිපාලන වියදම්වල ඇතුලත් කර තිබුණි. | 2021 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම්වල තොරතුරු සත්‍ය තත්ත්වය හෙළිදරව් වන අයුරින් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | 2018 මිල දී ගන්නා ලද තොග පාලන පද්ධතිය සඳහා සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය රු.1,000,000 ගිණුම්ගත නොකිරීම නිසා වර්ෂයේ ක්ෂය සහ ක්ෂය වෙන්කිරීම් රු.1,000,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | සමුච්චිත ක්ෂය මුදල 2021 වර්ෂයේ ගිණුම් හරහා අදාල නිවැරදි කිරීම් සිදුකරනු ඇත. | ක්ෂයවීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයට අදාල ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොළිය රු.3,755,587 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2021 වර්ෂයේ ගිණුම් වලින් නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | ලැබිය යුතු පොලී ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ඊ) | මණ්ඩලයේ ජංගම ගිණුම් 8 ක තැන්පත් කළ නමුත් බැංකුවට බැර නොවූ තැන්පතු වල වටිනාකම රු.54,707,458 ක් වූ අතර එම තැන්පතු 2011 සිට 2020 දක්වා කාලය තුල තැන්පත් කිරීම් විය. එම බැර නොවූ තැන්පතු හඳුනා ගැනීමට සමාලෝචිත වර්ෂය වන විටත් කටයුතු කර නොතිබුණු අතර ප්‍රමාද කාලය වසර 9 සිට මාස 1 දක්වා තිබුණි. | 2020 වර්ෂයට පෙර බැංකුවට බැර නොවූ තැන්පතු ද නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | තැන්පතු හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |
| (උ) | මණ්ඩලයේ මහජන බැංකුවේ ගිණුම් අංක 014-1-002-7-0002717 දරන ජංගම ගිණුමේ 2020 දෙසැම්බර් 31 දිනට මුදල් පොතට අනුව රු.69,449,720 ක අයිරාවක් පැවතුනත් බැංකුවේ ශේෂ සනාථන කිරීම් අනුව අයිරාවක් නොමැති බවට ශේෂ සනාථන නිකුත් කර තිබුණි. ඉදිරිපත් කර ඇති බැංකු සැසඳුමට අනුව තැන්පත් කල නමුත් බැර නොවූ ශේෂ වටිනාකම රු.2,978,447,880 ක් හා නිකුත් කල නමුත් ඉදිරිපත් නොවූචෙක්පත් වල වටිනාකම රු.3,047,897,600 ක් විය. ඉහත ශේෂයන් හඳුනාගෙන මුදල් පොතේ බැංකු අයිරාව නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද මෙම ශේෂය 2018 වර්ෂයේ සිට මේ දක්වා නොවෙනස්වී පවතින බවද නිරීක්ෂණය විය. | මෙම ගිණුමේ ශේෂ හඳුනාගෙන මුදල් පොතේ අයිරාව නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතියි. | අයිරාව හඳුනාගෙන ගිණුම් නිවැරදි කළ යුතුය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ මුලා ප්‍රකාශනවල මාර්ගස්ථ තොග ලෙස රු. 2,234,953 ක් දක්වා තිබුණු අතර මෙම තොගය නොවෙනස්ව 2018 වර්ෂයේ සිට මේ දක්වාම පැවතුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් වී නොතිබුණි. | වී මෝල් හිමියන්ගෙන් ලැබිය යුතු ව පවතින ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කරමින් පවතියි. | හඳුනාගෙන ගිණුම් නිවැරදි කල යුතුය. |

**1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විෂයය | මූලා‍ය ප්‍රකාශන අනුව වටිනාකම (රු.) | අනුරූපී වාර්තා අනුව වටිනාකම (රු.) | වෙනස (රු.) | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (i) | ණයගැතියෝ (ආහාර කොමසාරිස් දෙපා.) | 436,543,583 | ශේෂ නොමැත | 436,543,583 | ශේෂ අතර වෙනස තහවුරු කර ගැනීම සඳහා ඉදිරියේදී කටයුතු කරනු ලබයි. | සැසඳීම් සිදුකර අදාල නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | ණයගැතියෝ (සතොස) | 1,392,190,102 | 998,796,552 | 393,393,550 | ශේෂ අතර වෙනස තහවුරු කර ගැනීම සඳහා ඉදිරියේදී කටයුතු කරනු ලබයි. | ණයගැති පාර්ෂවයෙන්ද ශේෂ සනාථන ලබාගෙන සැසඳීම් සිදු කර ගිණුම්වල නිවැරදි අගයන් දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (iii) | ණයගැතියෝ (ලංකා සතොස ) | 809,417,974 | 706,324,615 | 103,093,359 | එම ශේෂ අතර වෙනස තහවුරු කර ගැනීම සඳහා ඉදිරියේදී කටයුතු කරනු ලබයි. | ශේෂ සනාථන ලබාගෙන සැසඳීම සිදු කර අදාල නිවැරදි කිරීම් සිදු කළ යුතුය. |
| (iv) | ණයහිමියෝ (සතොස) | 1,202,897 | 92,189,699 | 90,986,802 | එම ශේෂ අතර වෙනස තහවුරු කර ගැනීම සඳහා ඉදිරියේදී කටයුතු කරනු ලබයි. | එම |

**1.5.4 අවිනිශ්චිත ගිණුම්**

| | විෂය | මුදල (රු.) | අවිනිශ්චිත ලෙස තිබූ කාලය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (i) | වී තොග අඩුමාන | 3,031,256,050 | වසර 4 කට අධික | නිරවුල් කර | කඩිනමින් හඳුනා ගැනීම සිදු කර ගිණුම් නිරවුල් |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ii) | අවිනිශ්චිත වී මිලදී ගැනුම් | 18,574,188 | | ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | කිරීමට කටයුතු කළ යුතුය. |
| (iii) | හඳුනා නොගත් වී මිලදී ගැනුම් | 70,818,163 | වසර 9 කට අධික | | |

### 1.5.5 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලය විසින් මිලදීගෙන තිබුණු වී තොග වෙළඳපොළ මිලට හා පිරිවැයට වඩා අඩු මිලකට විකිණීම හේතුවෙන් ඊළඟ කන්නයේ වී මිලදීගැනීම සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනීම හා අලෙවියෙන් වූ පාඩු පියවා ගැනීමට වාර්ෂිකව මහා භාණ්ඩාගාරයෙන් සහ රාජ්‍ය බැංකු වෙතින් ණය පහසුකම් ලබා ගැනීමට කටයුතු කර තිබුණි. 2009 වසරේ සිට 2014 වසර දක්වා වී මිලදී ගැනීම හා මෙහෙයුම් වියදම් සඳහා රජයේ බැංකු 02 කින් ලබාගෙන තිබුණු ණය හා අත්තිකාරම් මුදලින් 2020 දෙසැම්බර් 31 දින වන විට සමුච්චිත ගෙවිය යුතු මුදල රු.මිලියන 22,652.79 ක් හා ඒ සඳහා ගෙවිය යුතු සමුච්චිත පොලි මුදල රු.මිලියන 28.67 ක් වී තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි අවධානය යොමුකළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂ තුනක ශුද්ධ වත්කම්වල හා සමාලෝචිත වර්ෂයේ ශුද්ධ වත්කම් වටිනාකම පිළිවෙලින් 2017 වර්ෂයේ රු.මිලියන 12,548.69 ක් වූ සෘණ අගය, 2018 වර්ෂයේදී රු.මිලියන 13,266.65 ක් බවට ද, 2019 වර්ෂයේදී රු.මිලියන 14,176.43 ක සෘණ අගයක් බවට හා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 14,656.26 ක සෘණ අගයක් බවට වර්ධනය වී තිබුණි. එය මණ්ඩලයේ අඛණ්ඩව පැවැත්මට අහිතකර ලෙස බලපා ඇති අතර මේ හේතුවෙන් රජයේ මූල්‍ය අනුග්‍රහයකින් තොරව වගකීම් පියවීමට ආයතනයට මූල්‍ය ශක්තියක් නොමැති බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොතිබුණි. | -එම- |

**1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| | **ණයගැති ශේෂ** | | | | |
| (i) | අමාත්‍යාංශ වී විකුණුම් | 32,688,410 | තහවුරු කිරිමේ ලේඛණ | ණය ගැති ශේෂ තුළ පවතින වටිනාකම් අයකර ගැනීම සඳහා, අමාත්‍යාංශ විගණන හා කළමණාකරන කමිටුව හා වෝහාරික විගණනය මගින් පෙන්වා දුන් පරිදි අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් අදාල ආයතනයන්හි ප්‍රධානීන් කැඳවා හමුවක් සූදානම් කරදෙන මෙන් ඉල්ලමින් 2023.05.22 දිනැති ලිපිය යොමුකර ඇත | වටිනාකම් තහවුරු කර ගැනීමට අවශ්‍ය සාක්ෂි ලබා ගත යුතුය. |
| (ii) | අමාත්‍යාංශයෙන් ලැබියයුතු | 264,154,465 | | | |
| (iii) | නෝර්ත් සී (North – Sea) | 1,000,000 | | | |
| (iv) | තල් සංවර්ධන අධිකාරිය | 700,000 | | | |
| (v) | මොල් හිමියන්ගේ ලැබිය යුතු | 61,699,951 | | | |
| (vi) | ලැබිය යුතු (අම්පාර දිස්ත්‍රික් ලේකම්) | 2,458,086 | විස්තරාත්මක උපලේඛණ | | |
| (vii) | ලැබිය යුතු (හම්බන්තොට දිස්ත්‍රික් ලේකම්) | 18,351,743 | | | |
| (viii) | රයිස් මිලස් අපනයන | 204,960,877 | | | |
| (ix) | රයිස් මිලස් (ණය පදනම වී විකුණුම්) | 44,399,804 | විස්තරාත්මක උපලේඛණ | අදාල ආයතනයන්හි ප්‍රධානීන් කැඳවා හමුවක් සූදානම් කරදෙන මෙන් ඉල්ලමින් 2023.05.22 දිනැති ලිපිය යොමුකර ඇත | ගිණුම් විෂයන්හි වටිනාකම් තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය ලිඛිත |
| (x) | රයිස් මිලස් (CWE & WF – 2016) | 8,027,716 | | | |

| | | | |
|---|---|---|---|
| (xi) | මිලදී ගැනුම් පාලන ගිණුම | 49,743,530 | සාක්ෂි පවත්වා ගෙන යා යුතුය |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට රු.3,706,737,098ක් වූ ණයගැති ශේෂය තුළ වසර 05කට වැඩි රු.1,931,134,627ක් සහ වසර 03ත් වසර 05ත් අතර රු.737,628,510ක ශේෂ පැවතුණි. | අදාල ආයතනයන්හි ප්‍රධානීන් කැදවා ඔවුන් සමග හමුවක් සූදානම් කර දෙන ලෙස ඉල්ලුම් කරමින් ලිපියක් යවා ඇති අතර ඒ සම්බන්ධයෙන් වන පිළිතුරු අපේක්ෂාවෙන් සිටිමි. | ණයගැති ශේෂ අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට රු.7,115,835,727ක් වූ ණයහිමි ශේෂය තුළ වසර 04කට වැඩි රු.6,723,668,939 ක්, වසර 03ත් වසර 04ත් අතර රු.278,938,959 ක්, වසර 01ත් වසර 03ත් අතර රු.64,973,673ක් හා අවුරුදු 01ට අඩු රු.48,254,157ක ශේෂ විය. මෙම ශේෂ තුල භාණ්ඩාගාරයට ගෙවිය යුතු රු.6,684,554,538ක් වූ අතර එම ශේෂ 2023 අප්‍රේල් 30 දින දක්වාම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ණයහිමි ශේෂ තුළ පවතින වටිනාකම් වලට අදාල ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන අතර වී අලෙවි මණ්ඩලය සතුව ප්‍රතිපාදන නොමැති හෙයින් භාණ්ඩාගාරයට ගෙවිය යුතු වටිනාකම ද මෙතෙක් ගෙවීමට නොහැකි වී ඇත. | පැරණි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6.3 අත්තිකාරම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පසුගිය වර්ෂවල සිට නිරවුල් නොකර තවදුරටත් පැවති නොපියවූ අත්තිකාරම් ශේෂය රු.12,131,961 ක් වූ අතර එම ශේෂය තුල පැවති රු.708,334 ක් වර්ෂයකට වැඩි කාලයක් ද, රු.469,734 ක ශේෂයක් වර්ෂ දෙකකට වැඩි කාලයක් ද රු.10,817,161 ක ශේෂය වර්ෂ තුනකට වැඩි කාලයක් ද, පැරණි ශේෂයන් විය. | පියවීම් සිදුකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | අත්තිකාරම් නොපමාව පියවීමට කටයුතු කළ යුතුය |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.396 | බැංකු ගිණුම් 04 කට අදාළව 2020 දෙසැම්බර් 31 දිනට නිකුත් කර වර්ෂ 2 සිට මාස 6 දක්වා කාලයක් ඉක්ම වූ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ රු.4,771,475 ක් වටිනා චෙක්පත් 37 ක් සම්බන්ධව කටයුතු කර නොතිබුණි. | ශේෂය පිළිබඳ බැංකුව වෙත ඉදිරිපත් වූයේද යන්න සොයා බලා පිළිතුර කඩිනමින් ඔබ වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ශේෂ හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කල යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,248,739,079 ක පාඩුවක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ පාඩුව රු.741,663,275 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.507,075,804 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් රු.36,796,638 කින් අඩුවීමද, මූල්‍ය වියදම රු.717,225,824 කින් වැඩිවීම ද ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වී අලෙවි මණ්ඩලයේ මූලික අරමුණ වන්නේ වී ගොවීන්ගෙන් සහතික මිලට අස්වැන්න මිල දී ගැනීම තුළින් ගොවි ජනතාවගේ දිළිඳුකම අඩු කර ගැනීම සහ ආරක්ෂිත තොගයක් පවත්වා ගනිමින් රට තුල ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීමයි.එම අරමුණු ඉටු කර ගැනීම සඳහා මණ්ඩලය සතුව පළාත් 07 ක මෙ. ටො 327,285 ක ධාරිතාවයක් සහිත ගබඩා 356 ක් පැවතුනත් 2023 වර්ෂයේ ජූලි 26 දින වන විට මණ්ඩලය සතුව පළාත් 7 හි ම වී තොග පැවතුනේ වී මෙට්‍රික් ටොන් 7511 ක් පමණි. ඒ අනුව එදින වන විට මුළු ගබඩා ධාරිතාවයෙන් උපයෝජනය වනුයේ 2.3% ක ධාරිතාවයක් පමණක් බව නිරීක්ෂණය විය. මණ්ඩලයේ සේවකයන් 136 සඳහා වැටුප් ලෙස රු.105,019,230 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ දරා තිබුණි. | වී අලෙවි මණ්ඩලය සතු සියලු ශක්තීන් පෙන්වා දෙමින් 2022/23 මහ කන්නයේ සහ 2023 යල කන්නයේ වී මිලදී ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 5ක් ඉදිරිපත් කර ඇත. | අරමුණු ඉටු කිරීමට කටයුතු කළ යුතුය |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශ** |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2020 වර්ෂයට අදාල ගිණුම් විගණනයට ඉදිරිපත් වූයේ 2023 අප්‍රේල් 26 දින වන අතර එහි ප්‍රමාද කාලය වසර 2 මාස 02 ක් වේ. | අදහස් දක්වා නොතිබුණි. | ගිණුම් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |